**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය** **2020.03.12**

# නව රිද්ම 02

## Making scheme

**සැකසුම - සංජීව ක්‍රිෂාන්ත රණසිංහ**

---

**1.**

**(i) මුල් කාලීන සන්නිවේදන ආකෘති අතර දක්නට නොලැබෙන හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතියෙහි දැකිය හැකි සුවිශේෂී මූලිකාංග නම් කොට ඒ පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.**

✓ බලපෑම

සන්නිවේදකයා ග්‍රාහකයා වෙතින් අපේක්ෂා කරන ආකල්පමය හෝ චර්යාමය වෙනසයි.

*නම් කිරීම ලකුණු - 02*
*විස්තර කිරීම ලකුණු -02*
*මුළු ලකුණු - 04*

**(ii) නව මාධ්‍ය සඳහා භාෂාව යොදා ගැනීමේදී දක්නට ලැබෙන විශේෂතා දෙකක් විස්තර කරන්න.**

- භාෂාව සංක්ෂිප්තව යොදා ගැනීම.
- විශේෂ සංඥා සංකේතාදිය බහුලව භාවිතා කිරීම.
- කෙටි යෙදුම්, වදන් ආදිය බහුලව යොදා ගැනීම.
- දේශීය භාෂා ඉංග්‍රීසි අක්ෂර යොදාගෙන ලිවීම.
- භාෂා සම්මිශ්‍රව යොදා ගැනීම.
- දේශීය භාෂා යොදාගන්නේ නම්, වෙනත් මෘදුකාංග අවශ්‍ය වීම.
- ඉංග්‍රීසි භාෂාවට ප්‍රමුඛතාවක් හිමිවීම.
- භාෂා භාවිතයේදී පොදු සම්මුතීන් අවම වීම.

*ලකුණු 4 X 2 = 08*
*මුළු ලකුණු = 08*

**(iii) පුරවැසි මාධ්‍යකරුවා, ජනමාධ්‍යවේදියාගෙන් වෙනස් වන ආකාර තුනක් විස්තර කරන්න.**

| පුරවැසි මාධ්‍යකරුවා | ජනමාධ්‍යවේදියා |
|---|---|
| 1. වෘත්තීය ජනමාධ්‍යවේදියෙක් නොවීම. | 1. වෘත්තීය ජනමාධ්‍යවේදියෙක් වීම. |
| 2. නිශ්චිත වේතනයක් නොලැබීම. | 2. නිශ්චිත වේතනයක් ලැබීම. |
| 3. බොහෝවිට ජනමාධ්‍යවේදය පිළිබඳ න්‍යායාත්මක දැනුමක් නොමැතිවීම. | 3. ජනමාධ්‍යවේදය පිළිබඳ න්‍යායාත්මක දැනුමක් සහිත වීම. |
| 4. බොහෝ විට විධිමත් පුහුණුවක් රහිත වීම. | 4. විධිමත් පුහුණුවක් සහිත වීම. |
| 5. පුරවැසි දෘෂ්ටිකෝණයෙන් සිද්ධි වාර්තා කිරීම. | 5. ආයතනික දෘෂ්ටිකෝණයට අනුව සිද්ධි වාර්තා කිරීම. |
| 6. බොහෝවිට මාධ්‍ය ආචාර ධර්ම පිළිබඳ අවබෝධයක් නොමැති වීම. | 6. මාධ්‍ය ආචාර ධර්ම පිළිබඳ අවබෝධයක් තිබිය යුතු වීම. |
| 7. ප්‍රාදේශීය ගැටලු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම. | 7. පොදු සමාජ කාරණා පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම. |
| 8. ආයතනගත ව්‍යුහයකට යටත් නොවීම. | 8. ආයතනගත ව්‍යුහයක් තුළ ක්‍රියාත්මක වීම. |
| 9. බෙහෝ විට සීමිත තාක්ෂණික උපකරණ භාවිත කිරීම. | 9. සැලසුම්සහගත ලෙස දියුණු තාක්ෂණික උපකරණ භාවිත කිරීම. |

*ලකුණු 4 X 3 = 12*
*මුළු ලකුණු = 12*

**(iv) ඔබ තෝරාගත් ජන මාධ්‍යයක් ඇසුරෙන් සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග හතරක් විමර්ශනය කරන්න.**

- මූලාශ්‍රය.
- සන්නිවේදකයා / ආකේතිකරය.
- පණිවිඩය / සංදේශය.
- මාධ්‍ය / නාලිකාව.
- ග්‍රාහකයා / විකේතිකරය.
- ප්‍රතිපෝෂණය.
- බාධක / ඝෝෂාව.
- බලපෑම.
- අත්දැකීම් පසුතලය.
- සන්දර්භය.

*(තෝරාගත් ජනමාධ්‍යයක් ඇසුරෙන් ඉහත මූලිකාංගවලින් හතරක් විස්තර කර තිබිය යුතුය.)*

*ලකුණු 4 X 4 = 16*
*මුළු ලකුණු = 16*



Sanjeewa Krishantha Ranasinghe

**2.**

**(i) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය ප්‍රශස්තව පවත්වා ගැනීම සඳහා ප්‍රගුණ කළ යුතු නිපුණතා හතරක් නම් කරන්න.**

- සහානුභූතිය (සහවේදනය)
- අභ්‍යාසය.
- ආවර්ජනය.
- විවිධ මූලාශ්‍ර මගින් විවිධාකාර වූ තොරතුරු සමුදායක් මනසේ රැස් කර ගැනීම.
- පුද්ගලයෙකු විසින් මනසෙහි රැස් කරගෙන ඇති විවිධ දේ අතුරින් තමන්ගේ සංදේශයට අවශ්‍ය තොරතුරු පමණක් තෝරා ගැනීම.
- තාර්කිකව තීරණ ගැනීම මඟින් සංදේශයේ ස්වභාවය නියාමනය කර ගැනීම.
- යෝග්‍ය පරිදි සංදේශ ඉදිරිපත් කිරීම.
- නිර්මාණාත්මක හැකියාව.
- දියුණු භාෂාත්මක හැකියාව.
- ස්ව සංකල්ප පෝෂණය.
- ප්‍රශස්ත ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වය සඳහා සිත හසරුවා ගැනීම.

**ලකුණු** 1 X 4 = 04

**මුළු ලකුණු** = 04

**(ii) ජන සන්නිවේදන ක්‍රියාවලියේදී සංදේශයට සිදුවන හානිය ප්‍රධාන මාධ්‍ය බාධක වර්ග දෙකට අදාළව නිදසුන් ඇසුරෙන් විස්තර කරන්න.**

**මාධ්‍ය බාධක** - ජන සන්නිවේදන ක්‍රියාවලියේදී සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා දක්වා සංදේශයක් ගමන් කිරීමේදී සන්නවේදන ක්‍රියාවලියට සිදුවන බාධාවන්ය.

- පුවත්පත් - තීන්ත බොද වීම ඡායා, රූප අපහැදිලි වීම
- ගුවන් විදුලිය - සංඛ්‍යාත පද්ධතියේ දුර්වලතා , ප්‍රතිවාදනය වීම
- රූපවාහිනිය - රූප රාමු අපැහැදිලි වීම, රූපවාහිනී තරංග දුර්වල වීම

**අර්ථ බාධක** - සංදේශයේ අර්ථය හරිහැටි අවබෝධ කරගැනීමට නොහැකිවීම නිසා සිදුවන බාධාවන්ය.

- පුවත්පත - විරාම ලකුණු, පද බෙදීම අපැහැදිලි වීම, විදග්ද භාෂාවක් යොදා ගැනීම
- ගුවන් විදුලිය - සංදේශ ඉදිරිපත් කරන භාෂාව අපැහැදිලි වීම, උච්ඡාරණ දෝෂ
- රූපවාහිනිය - තාක්ෂණික හෝ පාරිභාෂික වචන වැඩි වශයෙන් යොදා ගැනීම, උච්ඡාරණ කිරීමේ දෝෂ

**ලකුණු** 4 X 2 = 08

**මුළු ලකුණු** = 08

**(iii) ජනමාධ්‍ය මගින් පුද්ගලයාගේ දෛනික න්‍යාය පත්‍රය ගොඩනැංවෙන ආකාරය කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න.**

- ජනමාධ්‍ය මගින්, විවිධ සමාජ සංසිද්ධීන් තම දෘෂ්ටිකෝණයට අනුව තොරා ගැනීම.
- ජනමාධ්‍ය මගින් තෝරාගත් තොරතුරු එමගින් තීරණය කරන ලද ප්‍රමුඛතාවන්ට අනුව සමාජ ගත කිරීම ඔස්සේ සමාජය දැනුම්වත් කිරීම.
- පුද්ගලයා විසින් එම මාධ්‍යයන්හි අන්තර්ගත සංදේශවල ප්‍රමුණතාවට අනුගතව තම න්‍යාය පත්‍රය සකසා ගැනීම.

*(ඉහත පියවර සුදුසු නිදසුන් ඇසුරින් විග්‍රහ කර තිබිය යුතුය.)*

**ලකුණු** 4 X 3 = 12

**මුළු ලකුණු** = 12

Sanjeewa Kishantha Ranasinghe

**(iv) වර්තමාන ජනමාධ්‍ය ක්‍රියාවලිය තුළ වාරණය ක්‍රියාත්මක වන විධි හතරක් උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න.**

- ප්‍රසිද්ධියේ නම් කිරීම
- දැන්වීම් මගින් පාලනය කිරීම
- බලපත්‍ර නිකුත් කිරීම / අවලංගු කිරීම / පවරා දීම
- බදු පැනවීම
- මාධ්‍ය ආයතනවලට අලාභ හානි සිදු කිරීම / ගිනි තැබීම
- නිසි බලධරයෙක් පත් කිරීම
- ත්‍යාග හා සංග්‍රහ ලබා දීම
- දඩුවම් කිරීම
- දඩ නියම කිරීම

*ලකුණු 4 X 4 = 16*

*මුළු ලකුණු = 16*

**3.**

**(i) ජාතික වශයෙන් අර්බුධාත්මක අවස්ථාවලදී රජය විසින් මාධ්‍ය සංදේශ වාරණය භාවිතයට ගනු ලබයි. සමාජ මාධ්‍ය වාරණය කිරීම නිසා සමාජයට සිදු වූ යහපතට හා අයහපතට අදාළව කරුණු දෙක බැගින් නම් කරන්න.**

**<u>යහපත</u>**

- ✓ සමාජ තුළ ව්‍යාජ තොරතුරු ව්‍යාප්තිය වැළකීම.
- ✓ සමාජය තුළ සාවද්‍ය තොරතුරු ව්‍යාප්තිය වැළකීම.
- ✓ සමාජයේ ව්‍යාකුල තත්ත්වයන් පාලනය කිරීමට හැකිවීම.
- ✓ පුද්ගල හා ජන වර්ග වලට සිදුවන අපහාස වැළැක්වීම.
- ✓ අසභ්‍ය සහ අශ්ලීල ප්‍රකාශන ජනගත වීම වැළැක්වීම.
- ✓ නෛතික තත්ත්වයන්ට අනුකූලව සමාජ පාලනය ගෙන යාමට හැකිවීම.
- ✓ මාධ්‍යයන්ගෙන් තහවුරු කළ නිල ප්‍රකාශන ලබා ගැනීමට හැකවීම.
- ✓ පුද්ගල බද්ධ අදහස් ප්‍රකාශනය සීමාවීම.
- ✓ වෛරී ප්‍රකාශන වැළැක්වීම.
- ✓ ආචාර ධර්ම උල්ලංඝනය වීම වැළැක්වීම.

**<u>අයහපත</u>**

- ✓ නිදහස් අදහස් ප්‍රකාශනය සීමා වීම.
- ✓ තොරතුරු දැනගැනීමේ නිදහස උල්ලංඝනය වීම.
- ✓ සාමාන්‍ය ජනතා හඬ යටපත්වීම.
- ✓ අධිපතිවාදී මතවාද ශක්තිමත්වීම.
- ✓ අවිධිමත් සන්නිවේදනය ශක්තිමත් වීම.
- ✓ මාධ්‍ය හා බැඳි ව්‍යාපාර ක්ෂේත්‍රය බිඳ වැටීම.
- ✓ නිර්මාණශීලී චින්තනයට බාධා ඇති වීම.
- ✓ ජනමත නිර්මාණයට බාධා ඇති වීම.
- ✓ විකල්ප මාධ්‍ය ක්‍රියාකාරීත්වය දුර්වලවීම.
- ✓ නිල නොවන ප්‍රකාශන බිහිවීමේ ප්‍රවණතා වර්ධනය වීම.

*යහපත 1 X 2 = 02*

*යහපත 1 X 2 = 02*

*මුළු ලකුණු = 04*

**(ii) ඔස්ගුඩ් ශ්‍රාම් ඉදිරිපත් කළ ආකෘතියට අනුව විකේතිකරය, ආකේතිකරය බවට පත්වීමට හේතු වන සාධකය නම් කොට එහි ඇති වැදගත්කම පිළිබඳව පැහැදිළි කරන්න.**

අර්ථකථනය / අර්ථනිරූපණය / අර්ථවිවරණය

- පණිවිඩය තුළ පවතින අන්තර්ගත කරුණු මනාව පැහැදිලි කර ගැනීම.
- සන්නිවේදනය අඛණ්ඩ ක්‍රියාවලියක් බවට පත් වීම.
- සන්නිවේදකයා ග්‍රාහකයා බවටත්, ග්‍රාහකයා සන්නිවේදකයා බවටත් පත්වීම.
- සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර පොදු මානසික තත්ත්වයක් ඇති වීම.

*නම් කිරීම - 02*

*විස්තර කිරීම - 02*

*මුළු ලකුණු = 04*



Sanjeewa Krishantha Ranasinghe

**(iii) විධිමත් හා අවිධිමත් සන්නිවේදනය අතර පවතින වෙනස්කම් තුනක් විස්තර කරන්න.**

| විධිමත් | අවිධිමත් |
|---|---|
| 1. මූලාශ්‍රය පැහැදිලි වීම. | 1. මූලාශ්‍රය පැහැදිලි නොවීම. |
| 2. අවිධිමත් සන්නිවේදනයට සාපේක්ෂව වේගවත් බවින් අඩු වීම. | 2. විධිමත් සන්න්වේදනයට සාපේක්ෂව වේගවත් බවින් වැඩිය. |
| 3. වගකිව යුත්තෙක් සිටීම. | 3. වගකිව යුත්තෙක් නොසිටීම. |
| 4. නිශ්චිත ධූරාවලියක් සහිතය.(විධිමත් දාම ඔස්සේ ක්‍රියාත්මක වේ.) | 4. නිශ්චිත ධූරාවලියක් නොමැත (අවිධිමත් දාම ඔස්සේ ක්‍රියාත්මක වේ.) |
| 5. නයාය පත්‍රයකට අනුව ක්‍රියාත්මක වේ. | 5. නයාය පත්‍රයක් නොමැත. |
| 6. නිශ්චිත ස්ථානයක්, කාලයක් පැවතීම. | 6. නිශ්චිත ස්තානයක්, කාලයක් නොපැවතීම. |
| 7. නිල ස්වභාවයක් පැවතීම. | 7. නිල ස්වභාවයක් නොමැතිවීම. |
| 8. අවිධිමත් සන්නිවේදනයට සාපේක්ෂව ලබා ගත හැකි තොරතුරු ප්‍රමාණය අඩුය. | 8. විධිමත් සන්නිවේදනයට සාපේක්ෂව ලබා ගත හැකි තොරතුරු ප්‍රමාණය වැඩිය. |
| 9. ක්‍රමානුකූල බවකින් යුක්තය. | 9. ක්‍රමානුකූල බවක් නොමැත. |
| 10. අවිධිමත් සන්නිවේදනයට සාපේක්ෂව තාක්ෂණික ක්‍රම වඩාත් ප්‍රබලව භාවිතයට ගත නොහැකිය. | 10. විධිමත් සන්නිවේදනයට සාපේක්ෂව තාක්ෂණික ක්‍රම වඩා ප්‍රබලව භාවිතයට ගත හැකිවීම.(දූරකථන, සමාජ ජාල) |
| 11. පිළිගැනීම් හා නියාමනයන් මත ක්‍රියාත්මක වේ. | 11. සැකය හා කුතුහලය මත ක්‍රියාත්මක වේ. |

*(විධිමත් සන්නිවේදනයේ සහ අවිධිමත් සන්නිවේදනයේ වෙනස්කම් පිළිබඳව සංසන්දනාත්මකව විස්තර කර ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබා දිය යුතුය.)*

*ලකුණු* 4 X 3 = 12

**(iv) සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග හතරක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.**

- මූලාශ්‍රය.
- සන්නිවේදකයා.
- ආකේත්තකරණය.
- පණිවිඩය.
- නාලිය / මාධ්‍ය.
- ග්‍රාහකයා.
- විකේත්තකරණය.
- ප්‍රතිපෝෂණය.
- බාධක.
- අත්දැකීම් පසුතලය.
- සන්දර්භය.
- බලපෑම.

*(නිදසුන් සහිතව පැහැදිලි කර තිබේ නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබා දිය යුතුය.)*

*ලකුණු* 4 X 4 = 16

**4.**

**(i) ආගමික අවස්ථාවකදී අනුගමනය කරන නිර්වාචික සන්නිවේදන ක්‍රම හතරක් නම් කරන්න.**

- ශබ්ද පූජාව.
- කොඩි ප්‍රදර්ශනය.
- වන්දනාමාන ඉරියව්.
- ආලෝක පූජාව.
- ධූම පූජාව.
- පැන් ඉසීම.
- පැන් වැඩීම.
- මල් පූජා කිරීම.
- ශරීර ආලේපන භාවිතය.
- ඇඳුම් පැලඳුම්.
- සැරසිලි.
- අභිචාර.
- ආහාර පූජාව.

*ලකුණු* 1 X 4 = 04

**(ii) සන්නිවේදනය සමාජය සඳහා වැදගත් වන ආකාරය පිළිබඳ කරුණු හතරක් නම් කොට, ඉන් දෙකක් පිළිබඳව විස්තර කරන්න.**

- තොරතුරු සම්පාදනය.
- පාර්ශව අතර සම්බන්ධතා.
- සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම.
- සමාජ සංවර්ධනයට පෙළඹවීම.
- උපදෙස් සම්පාදනය.
- දැනුම ලබා ගැනීම.
- ගැටුම් අවම කර ගැනීම.
- මිත්‍ර/ඥාතිසම්බන්ධතා වර්ධනය.
- සමාජ ආයතන ගොඩනැගීම.
- පුද්ගල සම්බන්ධතා මතුකර දැක්වීම.
- සමාජ ක්‍රියාකාරීත්වය හැසිරවීම.
- විශ්‍රාන්තිය ලබා ගැනීම / විනෝදය ලබා ගැනීම.

*නම් කිරීම* 1 X 4 = 04


*විස්තර කිරීමට* 2 X 2 = 04

*මුළු ලකුණු* = 08



Sanjeewa Krishantha Ranasinghe

**(iii) ඔස්ගුඩ් - ශ්‍රාම් සන්නිවේදන ආකෘතිය ඇඳ එහි මූලිකාංග ගලායන අයුරු විස්තර කරන්න.**




*ආකෘතිය ඇඳීමට ලකුණු 04*
*විස්තර කිරීමට ලකුණු 08*
*මුළු ලකුණු 12*

**(iv) මාධ්‍ය අභිසාරීතාව නිසා ජනමාධ්‍ය හා එහි ග්‍රාහක ස්වභාවය වෙනස් වී ඇති ආකාරය කරුණු හතරක් ඔස්සේ විග්‍රහ කරන්න.**

- විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය අන්තර්ජාලය පදනම්ව එක් වේදිකාවකට පැමිණීම.
- ග්‍රාහක සමාජය කුඩා කොටස්වලට වෙන්වීම.
- විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සුහුරු ජංගම දුරකථනය (Smart Phone) අධාරයෙන් පරිශීලනය කිරීම.
- සක්‍රීය ග්‍රාහකයෙක් බිහිවීම.
- සංවාද සඳහා වේදිකාව නිර්මාණය වීම.
- බහු මාධ්‍ය පරිශීලන අවස්ථා උදාවීම.
- ජනමාධ්‍යයේ භූගෝලීය සීමා අතික්‍රමණය කිරීම.
- පුළුල් ග්‍රාහක ස්වභාවයට අනුව ජනමාධ්‍ය අන්තර්ගතය තීරණය වීම.
- මාධ්‍යකරුවාගේ භූමිකාව වෙනස්වීම හා පුළුල් වීම.

ලකුණු 4 X 4 = 16

**5.**

**(i) සන්නිවේදන ක්‍රියාවලිය හඳුනා ගැනීමේදී ඉතා වැදගත්වන චාල්ස් කූලීගේ නිර්වචනය ලියා දක්වන්න.**

මානව සම්බන්ධතා රඳවා සිටින්නා වූත්, වර්ධනය කරන්නා වූත්, සියලු සංකේත මෙන්ම, ඒවා දේශයෙන් දේශයට ප්‍රවාහනය කිරීමටත්, කාලයේ බැඳුම්වලින් ඔබ්බට ගොස් සුරක්ෂිත කර ගැනීමටත් උපකාරී වන උපක්‍රම සන්නිවේදනයයි.

ලකුණු 04

**(ii) පාසල් මාධ්‍ය කවයේ දී සමූහ සන්නිවේදනය යොදා ගැනීමේ ප්‍රයෝජන දෙකක් කෙටියෙන් විස්තර කරන්න.**


- සාමූහිකව සාකච්ඡා කළ හැකිවීම.
- පොදු සම්මුතියකට එළඹිය හැකිවීම.
- සාමූහික කුසලතා මතුකරගත හැකිවීම.
- සාමූහික කුසලතා භාවිත කිරීමේ හැකියාව.
- දැනුම, අත්දැකීම්, සම්පත් හුවමාරු යනාදී කටයුතුවලදී යොදාගත හැකිවීම.
- නව අදහස් හා මතවාද දැනගැනීමට හැකිවීම.
- පොදු, අධ්‍යාපනික, රසවින්දන යනාදී කටයුතුවලදී යොදාගත හැකිවීම.
- සාමූහික නිර්මාණ කටයුතු වලදී යොදාගත හැකිවීම.
- පාසල තුළදී සිදු කෙරෙන ව්‍යාපෘතිවලදී යොදාගත හැකිවීම.

ලකුණු 4 X 2 = 08


Sanjeewa Krishantha Ranasinghe

**(iii) හැරල්ඩ් ඩී. ලැස්වෙල් හා ඇරිස්ටෝටල් ආකෘතිය අතර ඇති වෙනස්කම් ආකෘති දෙක ඇද පැහැදිලි කරන්න.**

- **හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතිය. (1948)**





- **ඇරිස්ටෝටල් ආකෘතිය**




| ලැස්වෙල් ආකෘතිය | ඇරිස්ටෝටල් ආකෘතිය |
|---|---|
| • සන්නිවේදකයෙකි.<br>• පණිවිඩයකි.<br>• මාධ්‍යයකි / නාලිකාවකි<br>• ග්‍රාහකයෙකි.<br>• හලපෑමකි. | • කථිකයෙකි.<br>• කථාවකි.<br>• අවස්ථාවකි.<br>• ශ්‍රාවකයෙකි.<br>• හලපෑමකි. |

*ආකෘති දෙක ඇද තිබීමට 6*
*වෙනස්කම් දක්වා තිබීමට 6*
*මුළු ලකුණු 12*

**(iv) HUB ආකෘතිය ඇඳ එහි මූලිකාංග හතරක් ක්‍රියාත්මක වන ආකාරය විස්තර කරන්න.**



1. සන්නිවේදකයෝ (Communicator)
2. කේත (Code)
3. දොරටුපාලකයෝ (Gatekeepers)
4. ජනමාධ්‍ය (Mass Media)
5. නියාමකයෝ (Regulator)
6. පෙරහනු (Filters)
7. ග්‍රාහක ක්ෂේත්‍ර (Audience)
8. බලපෑම් (Effects)

*HUB ආකෘතිය ඇද තිබීමට ලකුණු 4*
*මූලිකාංග හතරක් විස්තර කිරීමට ලකුණු 3 X 4= 12*
*මුළු ලකුණු 16*

wa Krishantha Ranasinghe